# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 160 — 1975 අප්‍රේල් 18 වැනි සිකුරාද — 1975.04.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (IIආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 475 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 481 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... | — |
| තොටුපල් රෙන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — | විවිධ දැන්වීම ... ... | — |


**සැළකිය යුතුයි.**—පොල් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත සහ මහවැලි සංවර්ධන මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 1975 අප්‍රේල් 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පල කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**වවුනියා නගරයේ රජයේ නිවාසවල දනට පාවිච්චි වන බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළිවලට හරවා ඉදි කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි.**

වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලනයට අයත් ගොඩනැගිලි නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා 1975 මැයි මස 06 වෙනි දින පෙරවරු 10 දක්වා වවුනියා කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රු. 10,000 (රුපියල් දහදහකට) හෝ ඊට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. 1975 මැයි මස 05 වැනි දින පස්වරු 2 දක්වා වවුනියා කච්චේරියේදී මේ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පත් නිකුත් කරනු ඇත.

3. ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් වැඩ වෙනුවෙන් රුපියල් 25ක මුදලක් වවුනියා කච්චේරියේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් වවුනියා දිසාපති වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, සමූපකාර සමිති සහ කම්කරු සමිති මෙකී ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කරනු ලැබේ. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. 1975 මැයි මස 06 වැනි දින පෙරවරු 10ට වවුනියා කච්චේරියේදී ටෙන්ඩර් විවෘත කෙරේ.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් බහාලන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් පස උඩ කෙළවර "බාල්දි වැසිකිළි ජල මුද්‍රිත වැසිකිළි බවට හැරවීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් ලියාපදිංචි කරන ලද තැපෑලෙන් නොඑවන්නේ නම් වවුනියා කච්චේරියේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ඒවා තැන්පත් කළ හැක.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතු අතර, එවැනි කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුත්තේ වැඩ කරන ප්‍රදේශයේ සිටින අයගෙනි.

7. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වෙනත් විස්තර වවුනියා දිසාපතිගෙන් ඉල්ලුම් කළ විට ගත හැකිය.

එස්. සිවඥානම්,
වවුනියා දිසාපති.

1975 අප්‍රේල් මස 03 වැනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දිය.

4-313—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පලවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පලවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---


475 ශී 71 03 15,546 (75/04)
B 1 ආ

11. ටෙන්ඩර් මණ්ඩලයේ අවසර නොමැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් වෙන කෙනෙකුට පැවරීම හෝ එහි කොටසක් වෙන කෙනෙකුට කුලියට දීම හෝ නොකළ යුතුය. කොන්ත්‍රාත්කරු වෙනුවට වැඩ කර ගෙන යාමට වෙන කෙනෙකුට බලය දෙමින් කොන්ත්‍රාත්කරු විසින් දෙන ලද ඇටෝර්නි බලයක් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිවාසිකම් රජය කෙරෙහි පවත්නේය.

12. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ නම ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

පී. ජී. පුංචිහේවා,
කළුතර දිසාපති.

1975 අප්‍රේල් මස 04 දින,
කළුතර දිසාපති කායඞාලයේදීය.

4–320/2 –75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

නැගෙනහිර දිසාව—මඩකලපුව

**මඩකලපුව දිස්ත්‍රික්කයේ රුගම් ව්‍යාපාරය වැඩිදියුණු කිරීම යටතේ මුත්දන් කුමාරවෙලි පිටාර වීමේ පහල ඇළෙහි ගල්පර ඉවත් කිරීම සඳහා ටෙන්ඩර්පත්**

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ, මඩකලපුවේ නැගෙනහිර දිසාවේ ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් හා ලාංකික ආයතනවලින් මඩකලපුව දිස්ත්‍රික්කයේ රුගම් ව්‍යාපාරය වැඩිදියුණු කිරීම යටතේ මුත්දන් කුමාරවෙලි පිටාර වීමේ පහල ඇළෙහි ගල්පර ඉවත් කිරීම සඳහා 1975 මැයි මස 14 වෙනි බදාදා පෙ. ව. 10 වන තෙක් ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 250ක් වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු, 1975 මැයි මස 9 වෙනිදා ප. ව. 2 දක්වා කාර්යාල වේලාවන්හිදී, මඩකලපුව නැගෙනහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය.

3. වැඩි විස්තර මඩකලපුව නැගෙනහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැක.

එස්. සුබ්‍රමණියම්,
වැඩ අධ්‍යක්ෂ, නැගෙනහිර දිසාව.

වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
නැගෙනහිර දිසාව,
මඩකලපුව,

4-305—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලය

ටෙන්ඩර් දැන්වීම් අංක : 4/1975

**කොහු කඹ සැපයීම**

කොළඹ-1, වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ, ඉංජිනේරු කළමනාකරු විසින් කොහු කඹ සැපයීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1975 මැයි 5 වෙනි දින ප. ව. 2.30 වනතෙක් භාර ගනු ලැබේ.

වැඩි විස්තර හා ටෙන්ඩර් පත් කොළඹ-1, වරාය සංයුක්ත මණ්ඩලයේ, ප්‍රධාන කාර්යාලයේ ලේකම් වෙතින් හෝ කොළඹ-13, වරාය සංයුක්ත මණ්ඩලයේ, ඉංජිනේරු කොට්ඨාශයේ, මිළයට ගැනීමේ නිලධාරි වෙතින් ලබාගත හැක.

ඉංජිනේරු කළමනාකරු.

4–282—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

1975 මුදල් වර්ෂය තුළ වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශය වෙත අමු ද්‍රව්‍ය සැපයීම

පහත අත්සන් කරනු ලබන මා විසින් වැලිකඩ බන්ධනාගාර කර්මාන්ත අංශයට 1975 මුදල් වර්ෂය තුළදී පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා ටෙන්ඩර් පත් 1975 මැයි මස 15 වැනි දින පෙරවරු 10.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිගනු ලබන්නේ ලාංකිකයින්ගෙන් පමණි.

3. ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පත් මුදල් පහත සඳහන් ද්‍රව්‍යයන් සම්බන්ධයෙන් මෙසේ වියයුතුයයි තීරණය කර ඇත :—

| සැපයුම් | | ටෙන්ඩර් තැන්පත් රු. | ශ. | | ඇප තැන්පත් රු. | ශ. |
|---|---|---|---|---|---|---|
| (අ) පිරිසිදු ඉරටු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ආ) ගල්ලැපත් | ... ... | 20 | 0 | ... | 300 | 0 |
| (ඇ) පිරපු කොහු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඈ) ගුදිරි කොහු | ... ... | 20 | 0 | ... | 200 | 0 |
| (ඉ) පොල්කටු අඟුරු | ... ... | 20 | 0 | ... | 200 | 0 |

විශේෂ විස්තර.—මෙම ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරය වෙත ගෙනැවිත් භාරදිය යුතුයි.

(අ) අඩි තුන (3) ක් දිග මෙරූ, වියලි පොල් කොළ සූරා පිරිසිදු කරන ලද ඒවා විය යුතුයි. වියලීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(ආ) දිගින් අඩි තුණ හමාරකට (3½) නොඅඩු පැදුරු විවීම සඳහා සුදුසු මහත ඒවා විය යුතුයි. වියලීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

(ඇ) ඉතා හොඳට නෙලන ලද වියලි, මුස්න සහ බුරුසු සෑදීමට සුදුසු ඒවා විය යුතුයි.

(ඈ) හින් කෙඳි සහිත කොහුබත් නොමැති ගුදිරි සෑදීමට සුදුසු නො 1 ඒවා විය යුතුයි.

(ඉ) මද පවනට දැවුනු දූවිලි වලින් තොර ඒවා විය යුතුයි. ප්‍රමාණය ඉස්මවා පිලිස්සී ඇති පොල් කටුඅඟුරු සහ හතරැස් අඟල් බාගයකට (½) අඩු කෑලි භාරගනු නොලැබේ. දූවිල්ල සඳහා 5% සිට බර ප්‍රමාණයන් අඩුකරනු ලැබේ.

ඉහත සඳහන් සෑම ද්‍රව්‍යයක් සඳහා වියලීම් බර වශයෙන් 5%ක් අඩුකරනු ඇත.

4. ඉහත දක්වා ඇති සැපයීම් සියල්ලම වෙනුවෙන් හෝ ඉන් කොටසක් පමණක් වෙනුවෙන් ටෙන්ඩර් කිරීමේ නිදහස ටෙන්ඩර්කරුවන් සතුය.

5. ඉහත නම්කර ඇති ද්‍රව්‍යයන් සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන අය විසින් ආදර්ශක (සැම්පල්) ඉදිරිපත් කරන විට ඒවායේ නම සහ ලිපිනය ලියා දිග ලියුම් කවරයක බහා පහත අත්සන්කරනු ලබන අයගේ කායඞාලයේ තැන්පත් කළ යුතුය. ආදර්ශක නොමැතිව ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ඇත.

6. පහත සඳහන් අයගෙන් නියමිත ටෙන්ඩර් පෝරම නිකුත් කිරීමේදී ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නොවේ :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතන ;
(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ;
(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂක විසින් අනුමත කරනු ලබන ග්‍රාම සංවර්ධන සමිති ;
(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

7. ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත පෝර්මයක් මගින් පමණකි. එය ලබාගත හැක්කේ 1975.05.14 වෙනි දින ප.ව. 2,00 දක්වා ඉහත සඳහන් ද්‍රව්‍යයන් සඳහා වෙන් වෙන් වශයෙන් මුදල් තැන්පත්කර ලබාගත් රිසිට්පත් ඉදිරිපත් කිරීමෙන් පමණක් බවත්, මෙ ටෙන්ඩර් තැන්පත් මුදල කොළඹ 9, බන්ධනාගාර මූලස්ථානයේ කායඞාලයේදීත්, කොළඹින් පිටතදී ඕනෑම කච්චේරියකදීත් තැන්පත් කළ හැකි බවත් සලකනු ලැබේ.

8. ටෙන්ඩර් පත්‍රයන් සීල් තැබූ කවරයන්හි බහා එහි වම් පස කෙළවරේ '......................' සැපයීම් සඳහා ටෙන්ඩරය යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ පහත අත්සන්කරන අයගේ කායඞාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීම කළ හැකිය.

9. නියම කරන ලද මිළ ගණන් ටෙන්ඩර් පත්‍රයන්හි අකුරින් හා ඉලක්කමින් දක්විය යුතුයි. එසේ අකුරින් හා ඉලක්කමින් සඳහන් නොකළ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ ඇත. ටෙන්ඩර් පත්‍රයක් පිරවූවාට පසු කිසියම් වෙනස් කිරීමක් හෝ එක් කිරීමක් කළහොත් ඒ බව ටෙන්ඩර්කරු විසින්ම අත්සන් යොදා සැබෑ බවට සහතික කළ යුතුයි.

10. නියමිත කාලසීමා තුළ අවශ්‍ය සැපයීම කිරීමට නොහැකි වුවහොත් එම සැපයීම ප්‍රමාදවන සෑම දිනයක් වෙනුවෙන්ම වන්දි ගෙවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ: එවැනි අවස්ථාවකදී කොන්ත්‍රාත්කරුවන්ට සැපයීමට නොහැකි වන සැපයීම් කොන්ත්‍රාත්කරුගේ වියදමින් වෙනත් මාර්ග වලින් ලබාගැනීමේ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරී සතුවේ.

11. වර්ෂ 1975 මැයි මස 15 වෙනි දින පෙරවරු 10.30 ට පහත අත්සන් කරන අයගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘතකරනු ලැබේ. එහිදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට පුළුවන.

12. සාර්ථක ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩර්කරන ලද කාර්යය ඉටුකිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරුට සිදුවේ.

13. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩරයන් හේතු රහිතව ප්‍රතික්ෂේප කිරීමට හා කොන්ත්‍රාත්තුව ඕනෑම අවස්ථාවකදී නවතාලීමේ සම්පූර්ණ අයිතිය බන්ධනාගාර කර්මාන්ත අධිකාරි වෙත පැවරී ඇත.

14. කොන්ත්‍රාත්තුව ලබාගැනීමට හැකි කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වා දින 10 ක් ඇතුලතදී බන්ධනාගාර කර්මාන්ත අධිකාරි සමග ගිවිසුමකට අත්සන් තැබිය යුතුය. එම කාලසීමාව තුළදී කොන්ත්‍රාත් ගිවිසුමකට අත්සන් කිරීම සඳහා ටෙන්ඩර්කරු අපොහොසත් උනිනම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කොට ඔහුගේ නම සහ ලිපිනය වගකීම් පැහැර හැරගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියෙහි ඇතුලත් කරනු ඇත.

15. තවත් වැඩි විස්තර දනගැනීමට ඇවැසිනම් පහත අත්සන්කරන අයගෙන් ලබාගැනීමට පුළුවන.

බන්ධනාගාර කර්මාන්ත අධිකාරී.

බන්ධනාගාර කර්මාන්ත අංශය,
වැලිකඩ බන්ධනාගාරය,
කොළඹ 9.

4-281—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පොල්ගොල්ල කලාත්මක රෙදිකර්මාන්ත ආයතනයට ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 1975. 05. 08 වැනි දින පෙ. ව. 10.00 වනතෙක් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක හෝ රජයේ අනුග්‍රහ ලබන සංස්ථාවක හෝ මණ්ඩලයක හෝ රු. 30,000 කට හෝ ඊට වැඩි වටිනාකමෙන් යුත් ගොඩනැගිලි කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරෙනු ඇත.

3. අපේක්ෂිත ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තු කාර්යාලයේ තැන්පත් කර, ලියා පදිංචි කිරීමේ සහතිකය හා පිහිටි පත 1975.05.07 වැනි දින දවල් 12.00 ට පෙර ඉදිරිපත් කළ යුතුයි.

පී. ඒ. ට. ගුණසිංහ,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1/1/48,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1,
1975.04.03.

4-359—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් උඩුනුවර බලවේග ආයතනයේ පැති බැම්මක් ඉදිකිරීම සහ පඩිපෙලක් සෑදීම සඳහා 1975. 05. 08 වැනි දින පෙ.ව. 10.00 වන තෙක් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක හෝ රජයේ අනුග්‍රහ ලබන සංස්ථාවක හෝ මණ්ඩලයක හෝ රු. 25,000 කට හෝ ඊට වැඩි වටිනාකමෙන් යුත් ගොඩනැගිලි කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කෙරෙනු ඇත.

3. අපේක්ෂිත ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීම සඳහා රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තු කාර්යාලයේ තැන්පත් කර, ලියා පදිංචි කිරීමේ සහතිකය හා පිහිටි පත 1975.05.07 වැනි දින දවල් 12.00ට පෙර, ඉදිරිපත් කළ යුතුයි.

කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.
පී. ඒ. ට. ගුණසිංහ,

යොමු අංකය : 3/1/1/49,
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල, කොළඹ 1,
1975.04.03.

4-340—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

## ධීවර දෙපාර්තමේන්තුව

### පිටත සවිකරන මෝටර ආනයනය කිරීම සඳහා ටෙන්ඩර්

ධීවර අධ්‍යක්ෂ විසින් අනුමත කෙරෙන පුද්ගලයිනට විකිණීම පිණිස පිටත සවිකරන මෝටර් ආයනය කිරීමේ අනුග්‍රහය සඳහා ශ්‍රී ලංකාවේ සිටින විදේශීය ප්‍රධාන වෙළඳ සමාගම්වල පිළිගත් දේශීය නියෝජිතවරුන්ගෙන් ලැබෙන සිල් තැබූ ටෙන්ඩර්පත් කොළඹ 3, ගාළු මුවදොර, ශ්‍රීමත් මොහමඩ් මාකන් මාකර් මවතු, ධීවර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1975 ජූනි මස 19 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 10. 00 දක්වා භාරගනු ලැබේ.

කොළඹ 3, ගාළු මුවදොර, ශ්‍රීමත් මොහමඩ් මාකන් මාකර් මාවතේ පිහිටි ධීවර අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් 1975. 06. 17 වැනි දින දහවල් 12. 00 දක්වා ලබාගත හැකි ටෙන්ඩර් පත්‍රවල නිශ්චිත වශයෙන් දක්වා ඇති ආකෘති පත්‍රයන්හි පිළියෙල කොට පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර් කරුවන් විසින් ධීවර අධ්‍යක්ෂගේ කාර්යාලයෙහි රු. 100 ක ආපසු නොගෙවනු ලබන මුදලක් තැන්පත් කළ යුතු අතර, ඒ සඳහා ලබා ගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉදිරිපත් කළ යුතු ය.

මේ පිළිබඳ වැඩි විස්තර ධීවර අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ඒ. අයි. මොහිදීන්,
ධීවර අධ්‍යක්ෂ.

1975. 04. මස 08 වැනි දින,
කොළඹ 3, ගාළු මුවදොර,
ධීවර දෙපාර්තමේන්තුවේ දීය.

4-345—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

---

## කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පොල්ගොල්ල, සාක්කපල්ලිය, අනුරාධපුරය, කුරුණෑගල, බණ්ඩාරවෙල, මාතලේ, නුවරඑළිය, කුරුවිට, කළුතර, ගාල්ල, ලේවැල්ල සහ කෑගල්ල බලවේග රෙදිකර්මාන්ත ව්‍යාපාරවලින් රෙදි නූල් මිලයට ගැනීම සහ ඉවත් කිරීම සඳහා, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1975. 05. 06 වැනි දින දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

වැඩිදුර විස්තර සහ ටෙන්ඩර් කොන්දේසි සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ විමසන්න.

පී. ඒ. ට. ගුණසිංහ,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1—(5/82).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1975. 04. 04.

4-358—75.04.18 දින අංක 160 දරණ ගැසට් පත්‍රය

(iii) අවශ්‍ය සහල් වී අලෙවි කිරීමේ මණ්ඩලයෙන් සලාක නොවන මිළ වන සේරුව රු. 2.15ට හෝ රජයෙන් නියම කරන මිළ ගණනට හෝ සපයනු ලබන අතර, පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සැපයුවහොත් ඒ සහල් සඳහා පාලන මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) සේවකයන්ට අර්ධ ආහාර පමණක් සපයනු ලැබේ. (එනම් රාත්‍රී ආහාර හෝ දිවා ආහාර ද, උදේ තේ හෝ සවස තේ ද) ප්‍රධාන ආහාරයට බත් පමණක් සැපයිය යුතුයි. (එනම් රාත්‍රී ආහාර හෝ දිවා ආහාර).

මෙම ආහාර සඳහා පාවිච්චි කළයුතු සහල් ප්‍රමාණය අවුන්ස 4¾කි. මෙම ආහාර වෙනුවට සහල් සලාක පොත් ලබාගත යුතු නොවේ.

(v) සහල් සළාක පොත්වලින් ලබාගත් සහල් නොමිලයේ ලබාගෙන ඇත්නම්, එම සහල්වල වටිනාකම සම්පූර්ණයෙන් ම කොන්ත්‍රාත්කරුගෙන් අඩු කරනු ලැබේ.

(vi) සේවකයන්ගේ සතියේ ආහාර සටහන් පහත සඳහන් අයුරු වේ :—

| | | |
|---|---|---|
| මාළු ආහාර | ... | දින 1යි |
| කරවල ආහාර | ... | දින 2යි |
| බිත්තර ආහාර | ... | දින 1යි |
| එලවළු ආහාර | ... | දින 3යි |

14. වී අලෙවි කිරීමේ මණ්ඩලයෙන් හෝ වි. සේ. ස. සමිතියෙන් හෝ සමූපකාර සමිතියෙන්. සහල් ප්‍රවාහනය කිරීමේ ගාස්තුව, කොන්ත්‍රාත්කරුවන් විසින් ඔවුන්ගේ වියදමින් ගෙවිය යුතුයි.

15. මෙම සංශෝධිත ආහාර ප්‍රමාණය පිළිබඳව විස්තර ටෙන්ඩර් පතට අමුණා ඇත. මෙම සංශෝධිත, රෝගීන්ගේ ආහාර ප්‍රමාණයන් අනුව, සතියේ ආහාර සටහන් පහත සඳහන් පරිදි සකස් විය යුතුය :—

| | | |
|---|---|---|
| එලවළු ආහාර | ... | දින 1යි |
| බිත්තර ආහාර | ... | දින 4යි |
| මාළු ආහාර (අළුත් මාළු) | | දින 2යි |

රෑ ආහාර සියළුම එළවළු ආහාර වේ. මෙම වෙනස්වීම් අනුව සතියේ දිනවල දහවල් ආහාරය සමග දින 4ක් තුළ බිත්තර සැපයිය යුතු අතර අනිකුත් දින දෙක තුළ අළුත් මාළු, කරවල හෝ ගව මස් සැපයිය යුතුය. බිත්තර හෝ මාළු ආහාරවලට ආදේශකයන් දීමට අවශ්‍ය අවස්ථාවන්හි දී එම ආදේශිකය විය යුත්තේ ගව මස් හෝ කරවලය. එසේ කිරීමේ දී බිත්තරයක් හෝ මාළු අවුන්ස දෙකක් වෙනුවට කරවල අවුන්ස ¾ක් හෝ ගව මස් අවුන්ස 2ක් දිය හැකිය. මේ අනුව ක්ෂය රෝගීන් හැර අනිකුත් සියළුම රෝගීන්ගේ රාත්‍රී ආහාරය සඳහා සැපයිය යුත්තේ එළවළු ආහාරය. මෙම නව ආහාර පරිමාණයන් අනුව ක්ෂය රෝගීන් සඳහා දෙන අමතර බිත්තරය ඔවුන්ගේ රාත්‍රී ආහාරය සඳහා සැමදම දිය යුතුය.

බත් වෙනුවට පාන් හෝ අල වර්ගයක් ආදේශිකයන් වශයෙන් දීමට අවශ්‍ය වන විට එසේ දිය යුතු පාන්වල හෝ අලවල ප්‍රමාණය ඉහත සඳහන් ආහාර පරිමාණයන් සමඟ ඇති සටහන අනුව විය යුතුය.

16. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාර දී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ නොමිළයේ හෝ 1966 දෙසැම්බර් මස 19 වැනි දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

පී. රත්නසභාපති,
සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
යාපනය, 1975.04.04.

### උපලේඛනය

| (1) ආයතනය | (2) තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් වලංගු කාලය | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයන්ට: මාළු | සේවකයන්ට: හරක් මස් | සේවකයන්ට: කර වල | සේවකයන්ට: බිත්තර | සේවකයන්ට: එළ වළු | රෝගීන්ට: මාළු | රෝගීන්ට: හරක් මස් | රෝගීන්ට: කර වල | රෝගීන්ට: බිත්තර | රෝගීන්ට: එළ වළු | (6) ටෙන්ඩර් අවසාන දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. මා. නි. මන්ඩතිව් ... | 100... | 300 | 21.5.75 සිට 31.12.75 එම | 170... | — | ... 140... | 260... | 260... | 170... | — | ... — ... | 300... | 85 | 75.5.14 පෙරවරු 10.00ට |
| 2. මා.නි. වේලනෙයි ... | 100... | 300 | | 215... | — | ... 60... | 350... | 250... | 425... | — | ... — ... | 825... | 175 | |

4-341—75.04.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

---

යොමුව : පිඇස්පි 2/16/75.

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### පෙන්තියෝන් යනාදිය සැපයීම

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පෙන්තියෝන් යනාදිය සැපයීම සඳහා පහත සඳහන් උපලේඛනයේ ප්‍රකාශිත අයවලුන්ගෙන් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ:—

(i) විදේශීය රටවල නමගිය නිපදවන්නෝ.
(ii) ලන්ඩනයේ රාජ්‍ය නියෝජිතයින්.
(iii) ඉන්දියාවේ කල්කටා නියෝජිතයින්.

2. සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, තැ.පෙ. 584 හිමි කොළඹ 10, 385 ඩීන්ස් පාර දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1975.6.17 දින පෙ.ව. 10.00 තෙක් භාර ගනු ලැබේ.

3. මෙම ටෙන්ඩරයට අදාල ටෙන්ඩර් ආකෘති, කොන්දේසි ආදිය නිකුත් කරනු ලබන්නේ—

(i) මා විසින් ම හෝ විදේශවල ඇති ලංකා නියෝජිතයින් මගින් ලේඛණගත කොට ඇති වෙළඳ සමාගම් වලින්,
(ii) ලංකාවේ විදේශ ආණ්ඩුවල නියෝජිතයින්.

4. ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට කැමති විදේශීය සමාගම්වලට අවශ්‍ය ටෙන්ඩර් කොන්දේසි, උප ලේඛන හා වෙනත් විස්තර ඉතාලිය, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය, පකිස්ථානය, ජපානය, ඉන්දියාව, බටහිර ජර්මනිය, ප්‍රංශය, කැනඩාව, නෙදර්ලන්තය, බැල්ජියම,

ඩෙන්මාර්ක්, ස්විස්ටර්ලන්තය ආදි රටවල වෙසෙන ලංකා රජයේ නියෝජිතයින්ගෙන් ලබා ගන්නා ලෙස ඒජන්තවරු සහ නියෝජිතයින් විදේශීය සමාගම් වලට උපදෙස් දිය යුතුයි.

5. ඉහත 2 වැනි ඡෙදයේ සඳහන් දින නියමිත වේලාවට නියමිත ස්ථානයේදී, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේ දී, ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ අනුමත නියෝජිතයිනට පැමිණීමට ඉඩ දෙනු ලැබේ.

6. මේ සම්බන්ධව විස්තර, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 355 හි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) ගෙන් ලබා ගත හැක.

ඇන්. කේ. පී. විජේසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ,
1975 අප්‍රේල් මස 3 වැනි දින.

අදාල උපලේඛනය

| *Item No.* | *Description* | *Estimated requirements* | *Packing required* |
|---|---|---|---|
| 1 | Fenthion 50% E.C. | 1,500 litres | In 50 litre cans |
| 2 | Sumithion | 12 litres | In 1 litre cans |

4-337—75.04.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

දන්වීමයි

අධිකරණය විසින් රාජසන්තක කරණ ලද පහත සඳහන් නඩුවලට අදාල භාණ්ඩ 1975 අප්‍රේල් මස 29 වැනි දින පෙ. ව. 11 සිට ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දන්වමි.

| නඩු අංකය | භාණ්ඩ විස්තර |
|---|---|
| 468 | කටු කම්බි රෝල් 8 යි |
| 469 | කටු කම්බි රෝල් 1 යි |

ගල්ගමුව මහේස්ත්‍රාත්,

75. 04. 04 දින්, මහව දිසා අධිකරණයේ දී ය.

4-331—75.04.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

---

මහෙස්ත්‍රාත් උසාවිය, මාලිගාකන්ද

ප්‍රසිද්ධ වෙන්දේසියයි

මාලිගාකන්ද මහෙස්ත්‍රාත් උසාවියේ රාජසන්තක කරන ලද හෝ එසේ නැත්නම් මෙතෙක් අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් පා පැදි 1975.05.16 වෙනි දින ප.ව. 4.00 ට වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

02. මෙතෙක් අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පා පැදිවලට අයිතිවාසිකම් යම්කිසිවෙකු විසින් ඉදිරිපත් කිරීමට කැමැති නම් එය 1975 මැයි මස 16 වැනි දිනට පෙර ඉදිරිපත් කළ යුතුයි. එසේ ඉදිරිපත් නොකළහොත් මෙම පා පැදි වෙන්දේසියේ විකිණීමට කටයුතු කරන බව මහජනයාට මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. පා පැදිවල ලැයිස්තුව පහත දක්වා ඇත :—

| | නඩු අංකය | | පා පැදි අංකය |
|---|---|---|---|
| 1. | ඒආර්/483/73 | ... | සි.සී. 1 |
| 2: | ඒආර්/465/72 | ... | ඒ.එජ්. 20598 |
| 3. | 56833 | ... | එජ්.බී. 1957 |
| 4. | 56833 | ... | ටී.ජී. 2356 |
| 5. | 81565 | ... | එජ්.ඒ. 3475 |
| 6. | ඒ.ආර්./86/73 | ... | සී.ඉසැඩ්. 142 |
| 7. | 72941 | ... | ඒ.එච්. 15438 |
| 8. | — | ... | සී.එල්. 40384 |
| 9. | — | ... | ජී. 315236 |
| 10. | — | ... | වී.ඕ. 1046 |
| 11. | — | ... | සී.යූ. 908 |
| 12. | — | ... | එන්. 546958 |
| 13. | — | ... | සී.බී. 488 |
| 14. | — | ... | බී.එජ්. 654 |
| 15. | — | ... | බී.ටී. 85503 |
| 16. | — | ... | එජ්.ටී. 39259 |
| 17. | — | ... | 733 |
| 18. | 6665 | ... | රේසින් වර්ගයේ පා පැදියක්. අංකයක් නැත. |
| 19. | — | ... | රජ් වර්ගයේ අලුත් පා පැදියක්. අංකයක් නැත |

ඇම්. එච්. බී. මොරායස්,
මහෙස්ත්‍රාත්.

1975 අප්‍රේල් මස 02 වැනි දින,
මාලිගාකන්ද, මහෙස්ත්‍රාත් උසාවියේ දී ය.

4-304—75.04.18 දින අංක 160 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

අතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළ කරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛණයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලග ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඉවමිනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වෙනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුය.

සෑ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා ඇයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න

### උපලේඛනය

### 1975

| මාසය | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| මාර්තු | 07.03.75 | සිකුරාද | 26.02.75 | බදාද | දවල් 12.00 |
| | 14.03.75 | සිකුරාද | 05.03.75 | බදාද | දවල් 12.00 |
| | 21.03.75 | සිකුරාද | 12.03.75 | බදාද | දවල් 12.00 |
| | 27.03.75 | බ්‍රහස්පතින්ද | 19.03.75 | බදාද | දවල් 12.00 |
| අප්‍රේල් | 04.04.75 | සිකුරාද | 25.03.75 | අඟහරුවාද | දවල් 12.00 |
| | 11.04.75 | සිකුරාද | 02.04.75 | බදාද | දවල් 12.00 |
| | 18.04.75 | සිකුරාද | 09.04.75 | බදාද | දවල් 12.00 |
| | 24.04.75 | බ්‍රහස්පතින්ද | 16.04.75 | බදාද | දවල් 12.00 |
| මැයි | 02.05.75 | සිකුරාද | 23.04.75 | බදාද | දවල් 12.00 |
| | 09.05.75 | සිකුරාද | 30.04.75 | බදාද | දවල් 12.00 |
| | 16.05.75 | සිකුරාද | 07.05.75 | බදාද | දවල් 12.00 |
| | 23.05.75 | සිකුරාද | 14.05.75 | බදාද | දවල් 12.00 |
| | 30.05.75 | සිකුරාද | 21.05.75 | බදාද | දවල් 12.00 |
| ජූනි | 06.06.75 | සිකුරාද | 28.05.75 | බදාද | දවල් 12.00 |
| | 13.06.75 | සිකුරාද | 04.06.75 | බදාද | දවල් 12.00 |
| | 20.06.75 | සිකුරාද | 11.06.75 | බදාද | දවල් 12.00 |
| | 27.06.75 | සිකුරාද | 18.06.75 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1975 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී